ආරක්ෂාව

ශ්‍රී ලංකාවේ මැතිවරණ උණුසුම දිනෙන් දිනම වැඩි වෙද්දී කොටි සංවිධානයේ සාතන රැල්ලද ඉහළ යන්නට පටන් ගත්තේ කලා සිටියදීමය.

මෙවර කොටින්ගේ ඉලක්කය වූයේ යුද හමුදා බුද්ධි අංශයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියෙකි. ඔහු යුද හමුදා සන්නද්ධ බුද්ධි බලකා රෙජිමේන්තු මාණ්ඩලික නිලධාරි (SO 1) ලෙස කටයුතු කළ දෙවන සන්නද්ධ බුද්ධි බලකායේ (2 MIC) හිටපු අණදෙන නිලධාරියා වූ ලුතිනන් කර්නල් රිස්වි මිඩින්ය. සැබවින්ම සටන් විරාමයෙන් පසුව සාතනය වූ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා වූයේද ඔහුය.

කිරිබත්ගොඩ, වැවේවත්ත ප්‍රදේශයේ වූ ඔහුගේ නිවසට මීටර් තුන්සියයක් පමණ එහායින් වූ මාර්ග බාධකයදී රිස්වි මිඩින් මහතාගේ නිල රථය තුළදීම මෙම සාතනය කර තිබිනි.

මෙම සාතනය කොටි සංවිධානය ලබාදුන් කොන්ත්‍රාත්තුවක් මත ත්‍රිකුණාමලයේ ක්‍රියාත්මක පාතාල කල්ලි ප්‍රබලයකු වූ අයිස් මංජු නමැත්තා විසින් සිදු කර ඇත. මෙම අයිස් මංජු නමැත්තා ත්‍රිකුණාමල එක්සත් ජාතික පක්ෂ සංවිධායක ආරියවතී ගලප්පත්ති මහත්මියගේ (ආරි අක්කා) ප්‍රධාන සගයකු බව බුද්ධි අංශ වාර්තා මගින් කල්තියාම හෙළිකර තිබීම නිසා මෙම සාතනයත් සමග එ.ජා.ප. මැතිවරණ ව්‍යාපාරයට බාධාවක් ඇති වන්නට විය.

මෙම අයිස් මංජු නමැත්තා කොන්ත්‍රාත් මිනීමැරුම් කප්පම ගැනීම ඇතුලු අපරාධ රැසකටම සම්බන්ධ සිංහල ජාතිකයකු බවත්, මොහුට කොටි සංවිධානය විසින් වෙනමම සාමාජික අංකයක් ලබාදී තිබුණු බවත් බුද්ධි අංශ වාර්තාවල සඳහන් විය. මොහු ත්‍රිකුණාමල, සාම්පූර් කොටි පාලන ප්‍රදේශයට ගොස් කොටි නායකයින් මුණගැසී පැමිණ මෙම සාතන දියත් කර ඇතැයි හෙළි විනි. රිස්වි මිඩින් මහතාගේ සාතනය කොටි සංවිධානය කළ බව තහවුරු වෙද්දීත් තම පටු දේශපාලන අරමුණු වෙනුවෙන් මෙය පෞද්ගලික ප්‍රශ්නයක් මත සිදු වූ මරණයක් බවට පෙන්වාදීමට ඇතැම් දේශපාලනඥයන් ගත් උත්සාහය ව්‍යර්ථ වුනි.

රිස්වි මිඩින් මහතාගේ සාතනයත් සමග සටන් විරාමය අත්හැන් කළදා සිට මේ දක්වා බුද්ධි අංශ නිලධාරීන් හා සෙබලුන් 17 දෙනකු ඇතුලු ආරක්ෂක අංශ සාමාජිකයන් 66 දෙනකු කොටි ප්‍රහාරවලින් මියගොස් ඇත. රජයේ ඔත්තුකරුවන් 32 ක් මෙම කාලය තුළ සාතනයට ලක් වී හමරය.

ගෞරවාන්විත සාමයකට මූල පුරමින් රජය සමග සටන් විරාමයක් අත්සන් තැබූ කොටි සංවිධානය මේ වන විට තම ඉලක්කයන් වෙත එකින් එක යමින් පවතී.

යුද හමුදා පළමුවන සන්නද්ධ බුද්ධි බලකායේ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් නිසාමි මුත්තලිෆ් මහතාව කොළඹ නාරාහේන්පිටදී ඉකුත් මැයි 31 දා සාතනය කර මාස පහක් ගිය තැනදී කොටි සංවිධානය විසින් දෙවන බුද්ධි බලකායේ හිටපු අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් මිඩින්ව සාතනය කළේ ඇඟට නොදැනිය.

මෙම සාතන සියල්ල දෙස පසු විපරමක් කරද්දී එළිවෙන්නේ කොටි සංවිධානය ගෞරවාන්විත සාමයකට මුවා වී තමන්ට අවශ්‍ය ඉලක්කය වෙත යන බවකි. මෙම කාලය තුළ සාතනය වූයෙන් විදේශ ඇමැති ලක්ෂ්මන් කදිර්ගාමර්, ලුතිනන් කර්නල් මුනාලින්, කර්නල් මිඩින්, පොලිස් ප්‍රධාන සුනිල් තාබෲ වැනි රටට අවශ්‍ය පුද්ගලයන්ය. ඒ සියලු දෙනා රටට අවශ්‍යව සිටි සම්පත්ය. යුද්ධය පැවැති සමයේ තමන්ට කරගත නොහැකිව තිබූ සාතනවලට යමින් බුද්ධි

කෙසේ වෙතත් ශ්‍රී ලංකා ගුවන් හමුදාව මෙන්ම රජයේ හමුදාවන් භීතියට පත් කරන තොරතුරක් යූ. ඒ. වී. යානය අතුරුදන් වූ පරික්ෂණ කිරිමේදි හෙළි විය. ඔත්තු බැලීමට ගිය එම යානයට වන්නියේ ඉරණමඩු කොටි ගුවන් පථයේ නවතා තිබූ සැහැල්ලු ගුවන් යානාවක් මගින් ප්‍රහාර එල්ල කර බිම දමා ඇතැයි රජයේ ඔත්තු අනාවරණය කළේ ය.

මාර්ලේ ඩොනල්ඩ් පෙරේරා මහතා මාධ්‍ය වෙත කරුණු පැහැදිලි කරන්නට විය.

කෙසේ වෙතත් ශ්‍රී ලංකා ගුවන් හමුදාව මෙන්ම රජයේ හමුදාවන් භීතියට පත් කරන

ගෞරවාන්විත සාමයකට මුවා වී ඉලක්කය වෙත

කොටි හීන් නූලෙන් වැඩ

ටී ආර් පෙරේරා

අංශයේ ප්‍රබල ඔත්තුකරුවන්ව මරා දමා රජයේ බුද්ධි තොරතුරු ජාලයට මරු පහරක් එල්ල කරන්නටද කොටින්ට හැකි විනි.

තමන් බලාපොරොත්තු වන ඊළාම් රාජ්‍ය දිනා ගැනීමේදී ඉදිරියේදී තමන්ට වන බාධක දුරු කරමින් ඉදිරියට යාමේ න්‍යායයක් මත කොටි තම සාතන රැල්ල ව්‍යාප්ත කර ඇත. බුද්ධි අංශ ජාලය බිඳ නොදැමුවහොත් තම

ක්‍රියාකාරකම් රටට මෙන්ම ලෝක ප්‍රජාවටද දැන ගන්නට ලැබෙන බවද කොටි සංවිධානය තේරුම් ගෙන ඇත. ඒ අනුව සිය සාතන රැල්ල ව්‍යාප්ත කර තිබේ. මිළග කොටි ඉලක්කය කවුරුන් විය හැකිද? යන්න කා අතරත් කතා බහට ලක් වී ඇත.

ඊළාම් රාජ්‍යය දිනා ගැනීමේ සටනක නිරත කොටි සංවිධානය සටන් විරාමයට මුවා වී රජයේ පාලන ප්‍රදේශවල සාතන කරගෙන යද්දී සටන් විරාම නිරීක්ෂණ කමිටුව නිහඬ පිළිවෙතක් අනුගමනය කරමින් සිටීම කාගේත් කතාබහට ලක්ව හමාරය.

රජයේ හමුදා ප්‍රධානින් සාතනය වෙද්දී නිහඬ පිළිවෙතක් අනුගමනය කරන සටන් විරාම නිරීක්ෂකයන්ට ඉකුත් 19 දා වවුනියාව, එළිනිකුලම් මුදා නොගත් ප්‍රදේශයේ ඉහළ අහසේදී ගුවන් හමුදාවට අයත් යූ.ඒ.වී. (නියමුවන් රහිත) වර්ගයේ ඔත්තු බලන යානයක් අතුරුදන් වූ අවස්ථාවේ කට පියාගෙන සිටීමට නොහැකි විය. එහිදී ඔවුන්ගේ නියම ස්වරූපය එළිපට ආවේය.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව සටන් විරාමය කඩ කර ඇතැයි සිදැධිය සැල වූ වහාම සටන් විරාම නිරීක්ෂකයන් පෙන්වා දුන්නේ පරික්ෂණ පැවැත්වීමටත් පෙරාතුවය.

එහෙත් මෙම සිද්ධියේදී සටන් විරාමය කඩ වූ බව නිරීක්ෂකයන් කළ ප්‍රකාශය ගුවන් හමුදාපතිවරයා ප්‍රමුඛ රජයේ හමුදා ප්‍රධානීන්ගේ දැඩි දෝෂ දර්ශනයට ලක් විය. ශ්‍රී ලංකාව ගුවන් තලය අයත් වන්නේ ශ්‍රී ලංකා ජනරජයට බැවින් ගුවනේ සැරිසැරීමට රටේ ආරක්ෂාව සම්බන්ධව නිරීක්ෂණ කටයුතු කිරීමට බලය ඇත්තේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බවට සටන් විරාම නිරීක්ෂකයන් දැන්වත් තේරුම් ගත යුතුයැයි ගුවන් හමුදාපති එයාර් තොරතුරක් යූ. ඒ. වී. යානය අතුරුදන් වූ පරික්ෂණ කිරිමේදි හෙළි විය.

ඔත්තු බැලීමට ගිය යූ. ඒ. වී. යානයට වන්නියේ ඉරණමඩු කොටි ගුවන් පථයේ නවතා තිබූ සැහැල්ලු ගුවන් යානාවක්. (ZLIN 143L) මගින් ප්‍රහාර එල්ල කර බිම දමා ඇතැයි රජයේ ඔත්තු අංශ කල අනාවරණයක් මීට හේතු විය. ඩොලර් මිලියනයක් පමණ වටිනා මෙම යූ. ඒ. වී. යානයේ ඔප්ටිකල් කැමරාව පහළට වනසේ සවිකර ඇති නිසා එයට ඉහළින් පැමිණෙන කිසිම දෙයක ඡායාරූප පාලක මධ්‍යස්ථානයට නොලැබී යාම නිසා මෙම යානය නැවත ගෙන්වා ගැනීමට කාලයක්ද නොමැති විය. යම් හෙයකින් එවැනි යානාවක් ගැන යූ. ඒ. වී. යානයේ කැමරාවේ සටනක් වූයේ නම් යූ. ඒ. වී. යානය ගෙන්වා ගැනීමට ඉඩක් තිබිනි.

සටන් විරාමයට මුවා වී ඉරණමඩුහි කොටි ගුවන් පථයක් ඉදිකිරීමටත්, සැහැල්ලු ගුවන් යානා ගෙන්වා ගැනීමටත් කටයුතු කළ කොටි සංවිධානය තමන්ට ගුවන් බලයක් ඇතැයි පෙන්වාදීම සඳහා මෙම පියවර ගත්තා විය හැක. මෙහි බරපලකම වනුයේ ඉදිරියේදී කොටි ගුවන් ප්‍රහාර හෝ මරාගෙන මැරෙන ප්‍රහාර රජයේ පාලන ප්‍රදේශවලත් බලාපොරොත්තු විය හැකි බැවිනි.

කොටි විවිධ ආකාරයෙන් තර්ජන එල්ල කරද්දී අගමැති මහින්ද රාජපක්ෂ, පාර්ලිමේන්තු මන්ත්‍රී විමල් වීරවංශ යන මහත්වරුන් ඉලක්ක කරගෙන මරාගෙන මැරෙන ගැබිණි කොටි කතුන් වන්නියේ සිට දකුණුට එවා ඇතැයි බුද්ධි අංශ හෙළි කරගෙන ඇත.

ගැබිණි කාන්තාවන් බොහෝ විට පරීක්ෂාවට ලක් නොවන නිසා මරාගෙන මැරෙන ඇඳුම් කට්ටල ඇන්ද යූ කොටින්ගේ මරාගෙන මැරෙන කාන්තාවන් ප්‍රහාර සඳහා යෙදවීම කොටින්ගේ අලුත්ම ඉලක්ක වී ඇත. අද හෙටම එවැනි බෝම්බකාරියන් කොළඹ දී බෝම්බ පුපුරාවා ගැනීමට ඉඩ ඇත.

කොටින්ගෙන් එල්ල වූ තර්ජන නිසා මගින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදා ගැනීමට කොළඹ සිටින ව්‍යාපාරිකයකු විසින් රුපියල් ලක්ෂ 55 ක් වියදම් කර විනයේ සිට වෙඩි නොවදින වීදුරු කුටි තුනක් ගෙන්වා දී තිබිනි. මීට අමතරව වෙඩි නොවදින තිරයක් වෙදිකාවේ සවි කිරීමටද අවධානය යොමු කර තිබිනි.

මෙම කුමන ආරක්ෂක සැලසුම් යෙදුවද තමන්ට අවස්ථාවක් ලැබෙන ඕනෑම අවස්ථාවක මගින්ද රාජපක්ෂ මහතා මෙන්ම විමල් වීරවංශ මහතාද තම ඉලක්කයන් කර ගැනීමට කොටි අර අදින බව බුද්ධි අංශ අනාවරණය කර ඇත.

මැතිවරණ සමයේ කොටි සන්නද්ධ අංශයේත් බුද්ධි අංශයේත් සාමාජිකයන් මෙන්ම දේශපාලන අංශයේත් සාමාජිකයන් කොළඹට ඒවා ඇත්තේද මෙම ඉලක්කයන් සපුරා ගැනීමට විය හැක. කොළඹ කොටි ක්‍රියාකාරකම්වල පහසුව තකා සාමාන්‍ය දෙමළ පවුල් ලෙසින් පැමිණි කොටි මහා විරු පවුල් (කොටි සාමාජිකයන්ගේ පවුල්) කොළඹ අවට පදිංචි කර ඇත.

කොළඹදී මහින්ද රාජපක්ෂ මහතාව සාතනය කිරීමට අර අදිද්දි උතුරු නැගෙනහිර මහා පරිමාණ ඡන්ද කොල්ලයකට කොටි අර අදින බව බුද්ධි අංශ අනාවරණය කළෙය. වන්නියේ හොර ඡන්ද පත්‍රිකා මේ වන විටත් මුද්‍රණය කරමින් සිටින බව හෙළි වී ඇත.

මීට අමතරව උතුරු නැගෙනහිර ඡන්ද පත්‍රිකා එකතු කර කොටි සාමාජිකයන් යොදවා ඡන්දය දිනයේදි එකවර ඡන්දය පාවිච්චි කිරීමේ සූදානමක්ද පවතී. මගින්ද රාජපක්ෂ මහතාට ඊ.පී.ඩී.පී. සංවිධානයේ හා කරුණා පිලේ සහාය පලකිරීමට ඉඩ ඇති හෙයින් එම ඡන්ද වැඩියෙන් වැටෙන ඡන්ද මධ්‍යස්ථාන අසල බෝම්බ පිපිරවීම් හා වෙඩි තැබීම් කර ඡන්දය දමීම වැළකීමේ සූදානමක්ද පවතී.

මේ ක්‍රියාදාමයන්ට විරුද්ධව කරුණා පාර්ශ්වය විසින් මහජනතා දැනුවත් කර ඡන්දය මගින්ද රාජපක්ෂ මහතාට ලබාදෙන ලෙසත් එමගින් දෙමළ ජනතාවගේ හා මුස්ලිම් ජනතාවගේ අයිතිවාසිකම් යුද්ධයකින් තොරව ලබාගත හැකි බවත් පෙන්වා දී ඇතැයි බුද්ධි අංශ හෙළි කර ඇත. මීට අමතරව විදේශ ගතව සිටින කරුණා පිලේ සහ ඊ. එම්. ඩී. එල්. එෂ්, ඊ.පී.ඩී.පී. සංවිධානවල සාමාජිකයන් විසින් දුරකතන පණිවුඩ මගින් මගින්ද රාජපක්ෂ මහතාට ඡන්දය දෙන ලෙසට ඔවුන්ගේ ඥාතීන් සහ හිතවතුන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙළක් අරඹා ඇතැයිද බුද්ධි අංශ කියයි. ■

6 පිටෙන්

ගායනා කරපු ඉරෙන් හඳෙන් සින්දුව මිතකදෑ හරිෂණ ගේ දෙවැනි සින්දු එකතුවත් දැන් පිටවෙලා. මේ දේවල් ලංකාවෙන් එන මාමාලා නැන්දලාට කියලා ගෙන්වගෙන අහන්න බලන්න. රස විඳින්න. මේ රටට ආවට පස්සෙ අපට නැතිවුණ දෙයක් තියෙන බව ඔයාලාට එතකොට දැනෙවි. ඒත් දුක හිතන්න ඕනෙ නෑ. ඒ දේවල් ලබාගන්න පාරවල් හැදෙනවා ඔයාලාට. ඒක එහෙම වෙන්න ම ඕනෙ.

පින්ගේ කෙඳි වලට හරි විඩාවයි.

කුඩා අයගෙ දස්සකම් අඳුනාගෙන ඒවා හැඩ වැඩ කරන එක ලේසි නෑ. පුදුම ඉවසිල්ලක්, කැපවීමක් තියෙන්න ඕනෙ. විශේෂෙයෙන්ම මේ රටේ ළමයින් අතරේ දවසේ වැඩි කොටසක් ගෙවන හැදෙන වැඩෙන ළමයි පෙරදිග ආරගේ අංශ වලට ගොමු කරවීම හරිම අමාරුයි. වමන උළුවාරණය ම ලොකු ප්‍රශ්නයක්. මේ වගේ අවිංකව කැපවෙලා දරන උත්සාහයක් තමයි වැනෙල් 33 ඉරිදා උදයේ විකාශය කරන ශ්‍රී ලන්කන් මෝනිං ෂෝ හි මාසික ළමා වැඩ සටහන. තමන්ගේ දැනුම කුසලතාව ළමයින්ට දායාද කරන්න උනන්දු වෙන විනීතා විශේෂෙරන්න ටත් ළමයින්ට ගෝවර වල විදිහට ලස්සනට පසුවීම සකස් කරන සරත් ජේරෙත්න ටත් සංගීතය සපයන සමන් රණබාහුටත් පෘතන කර ඉදිරිපත් කරන නිමල් අල්විස් ටත් පුංශසා කරන්න ඕනෙ.

පන් පින්ගේ ලිපියට ඌණ පූරණයක් ලිව්වා. පින් ලිතන අතරේ පන් නිකම්ම හිරිවේ නැහැසා පින් පසුගිය වතාවේ ඇන්ද දරුවාවා ටිකක් හැඩ වැඩ කළා. පින් ඒකට අලුත් අදහසක් එක් වෙන විදියට බාල වියෙන් පිටමං වෙලා යන විඩි වියපත් දැරියක් ඇඳලා එක්කලා. එමා විෂේ සුන්දර මතකය ඇයගේ ඉදිරි ගමනේ දී ගෙන යන ගමන් මලු වල පිරිලා. ■